සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2567 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2020/2021/2022(2023)** **03 S**

පැය තුනයි

## (03) ශාසන ඉතිහාසය

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවේ අන්තර්ගතය කෙටියෙන් දක්වන්න. (ලකුණු 06 යි)
   (ii) බුදුරජාණන් වහන්සේ ධර්මදූත ව්‍යාපාරය මගින් අපේක්ෂා කළ අරමුණ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iii) බුදුරජාණන් වහන්සේ ආරම්භ කළ ධර්මදූත සේවාව සාර්ථක වීම සඳහා උන්වහන්සේ තුළ පැවති ගුණ සමුදාය ඉවහල් වූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

2. (i) 'බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාව ප්‍රිය කළ ශාස්තෘවරයෙකි.' මේ ප්‍රකාශය අවස්ථා දෙකක් ඇසුරින් තහවුරු කරන්න. (ලකුණු 06 යි)
   (ii) බුදුරදුන් ජීවමාන සමයේ දී බුදු සසුනේ ව්‍යාප්තිය හා සංරක්ෂණය සඳහා රජවරුන්ගෙන් ලද අනුග්‍රහය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iii) බුදුන් වහන්සේ ධර්මදේශනා කිරීමේ දී උපයෝගී කරගත් සන්නිවේදන ක්‍රම පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 08 යි)

3. (i) සංඝ සමාජයේ ආරම්භය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   (ii) බෞද්ධ භික්ෂුව සංචාරක ජීවන පිළිවෙතින් ආරාමික ජීවන පිළිවෙතට යොමු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iii) පැවිදි උපසම්පදා **නොකළ** යුතු පුද්ගලයන් සිවු දෙනෙක් දක්වා එම පැනවීමේ යෝග්‍යතාව විස්තර කරන්න. (ලකුණු 08 යි)

4. (i) බෞද්ධ ධර්ම සංගායනා කුමන අරමුණු ඇතිව ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙළක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (ii) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 06 යි)
   (iii) හේතුව, කාලය, මූලිකත්වය, සහභාගිත්වය සහ ස්ථානය ආදී කරුණු ඇතුළත් වන සේ දෙවන ධර්ම සංගායනාව පිළිබඳ සටහනක් පිළියෙල කරන්න. (ලකුණු 08 යි)

5. (i) අශෝක රජතුමා බුදු සමය වැළඳගැනීමේ පුවත කෙටියෙන් දක්වන්න. (ලකුණු 06 යි)
   (ii) අශෝක ධර්මය සම්බන්ධයෙන් උගතුන් **තිදෙනකු** විසින් පළ කරන ලද අදහස් ලියා දක්වන්න. (ලකුණු 06 යි)
   (iii) අශෝක රජතුමා ධර්මය ප්‍රචාරය කිරීම පිණිස අනුගමනය කළ ක්‍රියා මාර්ග හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

**II කොටස**

6. (i) බුදුරදුන් ලක්දිවට වැඩම කිරීමට හේතු වූ කරුණු මොනවා දැයි ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(ii) මහින්දාගමනයට පෙර ලක්දිව පැවති ආගමික ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 06 යි)

(iii) මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජු මුණගැසීමේ ඓතිහාසික කථා ප්‍රවෘත්තිය ගෙනහැර දක්වන්න. (ලකුණු 08 යි)

7. (i) බෝධි වෘක්ෂය බෞද්ධයන්ගේ පූජනීය වස්තුවක් වීමට බල පෑ හේතු දක්වන්න. (ලකුණු 06 යි)

(ii) ශ්‍රී මහාබෝධි ශාඛාව ලක්දිවට වැඩම කරවීමේ සිද්ධිය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී මහාබෝධීන් වහන්සේ ලක්දිවට වැඩම කරවීමෙන් පසු ලක්දිව ඇති වූ ආගමික ප්‍රබෝධය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 08 යි)

8. (i) ලක්දිව ආරම්භ වූ භික්ෂුණී සමාජය සම්බන්ධ තොරතුරු ඇතුළත් මූලාශ්‍ර තුනක් ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(ii) ලක්දිව භික්ෂුණී සමාජයේ ආරම්භය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ලක්දිව භික්ෂුණී සමාජයේ පරිහානියට බල පෑ හේතු කවරේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

9. (i) දළදා වහන්සේ වැඩම වීමට පෙර ලක්දිව ධාතු පූජා පැවැත්වූ බවට ඇති සාධක තුනක් දක්වන්න. (ලකුණු 06 යි)

(ii) 'දළදා වහන්සේ ලංකාවේ රාජ්‍ය උරුමයේ සංකේතය යි.' පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) දළදා වහන්සේ හා බැඳුණු පූජෝපහාර විධි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

10. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) අභයගිරි විහාරය

(ii) මොග්ගලීපුත්තතිස්ස තෙරණුවෝ

(iii) කඨින පුණ්‍යෝත්සවය

(iv) බිම්බිසාර රජතුමා

(v) මහා විහාරය

(vi) ලක්දිව කලා ශිල්ප

(vii) වජ්ජි ජනපදය

(viii) සිවුවන ධර්ම සංගායනාව

(ලකුණු 05 × 4 = 20 යි)

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library